# තර්කාභාස

- **නො අදාලබව පිළිබඳ ආභාස**

යම් නිගමනයක් සනාථ කරනු වස් ඉදිරිපත් කරන සාක්ෂි තර්කයට අදාල විය යුතුය. අදාල නොවන කරුණු එනම් තර්ජනාත්මක ස්වරූපයෙන් ,අනුකම්පාව ලබාගැනීමේ ස්වරූපයෙන්, ආවේගයන් ඉස්මතු කරන අන්දමින් පෞද්ගලිකත්වය ඈඳා ගැනීමේ ස්වරූපයෙන් සම්මතයන්, සම්ප්‍රදායන්, විශේෂ තත්ත්ව යටතේ හෝ අවස්ථා හෝ යටතේ ගැනීමෙන් මෙම ආභාසය සිදුවේ. පහත සඳහන් ආභාස වර්ග මෙයට අදාල වේ.

1. **තර්ජනාත්මක ආභාසය**

නිගමනයට අදාල හේතු යුක්ති දක්වනු වෙනුවට සෘජුව හෝ වක්‍රව පුද්ගලයා බියට හෝ මානසික පීඩනයකට හසු කිරීමෙන් කරුණු පිළිගැන්වීමට තර්ක කිරීම මඟින් මෙම ආභාසය සිදු වේ.

උදා : අපගේ සංවිධානයට විරුද්ධව ඕනෑම අයෙකුට අයිතියක් ඇත. එහෙත් ඔවුන්ගේ ආරක්ෂාව ගැන නම් අපට සහතික විය නොහැකිය.

උදා : ගතයුතු ක්‍රියා මාර්ගය අපට ඡන්දය දීම බව පෙනී යා යුතුය. මක්නිසාදයත් ඔබ අපට ජන්දය නොදුන්නොත් ඔබේ ගමට ආධාර මුදල් ලැබෙන්නේ නැති නිසාය.

2. **දෛන්‍ය මූල්‍ය ආභාසය**

නිගමනයට අදාල කරුණු වෙනුවට අසන්නා තුළ අනුකම්පාව ඇතිවීමට තුඩුදෙන කරුණු ගෙනහැර පාමින් නිගමනය සනාථ කිරීමට යාම දෛන්‍ය මූල්‍ය ආභාසයයි.

උදා : විත්තිකරුට දරුවන් 6 දෙනෙක් ඇත. වැඩිමලා තවමත් අවුරුදු 10 ක් වත් නැති කුඩා ළමයෙකි. ඔවුන්ගේ මව ද ජීවතුන් අතර නැත. එහෙයින් විත්තිකරු නිවැරදි කරුයැයි නිගමනය කළ යුතුය.

3. **ජනෝද්වේජන තර්කාභාසය**

මෙහිදී කෝපය, වෛරය වැනි චිත්ත වේගයන් ඉස්මතු කරලීම තුලින් අසන්නා මුලාවට පත්කොට නිගමනය ඔප්පු කිරීමට උත්සාහ ගැනීම දැකිය හැකිය.

උදා : ඔබ සිංහලයෙකු වශයෙන් මෙයට වඩා ජාතිය ගැන සිතිය යුතුය. මන්ද අන් බොහෝ ජාතීන්ට ජීවත් වීම සඳහා විවිධ රටවල් ඇත.සිංහලයන් වශයෙන් අපට ඇත්තේ මේ කුඩා දිවයින පමණි.

උදා : දනින් වැටී ජීවත්වනවාට වඩා දෙපයින් සිට මියයාම යහපත් නොවේද? අඳුරේ සිට මියයාමට ඔබ අකමැති බව මම දනිමි. එහෙයින් X අපේක්ෂකයාට ඔබගේ ඡන්දය දෙන්න.

4. **පුද්ගලාලම්බන තර්කාභාසය**

කාරණයට අදාල සාක්ෂි ගෙනහැර පෑම වෙනුවට ඒ කරුණ හා සම්බන්ධ පුද්ගලයාගේ පෞද්ගලිකත්වය ඉස්මතුකරලීමෙන් ඒ මත නිගමනය තහවුරු කිරීමට උත්සාහ කිරීම මෙහිදී සිදුවේ.

උදා : දෙවන ලෝක යුද්ධයේදී හිට්ලර්ගේ පාබල හමුදාව මෙහෙයවන ලද්දේ ඔහුගේ හොඳම සෙන්පතියා වන රොමෙල් යටතේය. එහෙයින් හිට්ලර්ගේ පාබල හමුදාව අති දක්ෂ එකක් බව අමුතුවෙන් කිවයුතු නොවේ.

උදා : මේ පොත කුණු කන්දලක් වනු නො අනුමානය මන්ද මේ පොතේ කතුවරයා වන්නියේ මිනිසෙක් වන නිසාය.

5. **යදෘච්ඡා ආභාසය**

කොන්දේසි සහිත සාමාන්‍ය තත්වයක් යටතේ පිළිගැනෙන කරුණක් සාක්ෂි වශයෙන් ගෙන එම තත්ත්වයන්ගෙන් බැහැර විශේෂ කරුණක් සනාථ කිරීමට යාම යදෘච්ඡා ආභාසයයි.

උදා: අවුරුදු 18 ඉක්මවූ සෑම පුරවැසියකුටම ජන්දය ප්‍රකාශ කිසීමේ අයිතිය ඇත. මේ උන්මත්තකාගාරයේ වෙසෙන්නන් උමතු රෝගීන් වුවද ඔවුන් අවුරුදු 18 ඉක්මවූ පුරවැසියන් වෙති. එහෙයින් ඔවුන්ට ද ඡන්ද බලය ඇත.

උදා : පුද්ගලයකුට අයිති දේ ඔහුට පැවරීම අප සතු යුතුකමකි. දැන් තව මිනිසකු හා බීමත්ව දබර කර ගන්නා $x$ නම් මිනිසා ඔහුට අයත් පිස්තෝලය ඉල්ලූ විටක ආපසු දීමේ පොරොන්දුව පිට මට තබා ගැනීමට දුන්නේය. දැන් ඔහුට එය අවශ්‍ය බව කියයි. එහෙයින් එය දැන් ඔහුට දීම මා සතු යුතුකමකි.

- <u>දුබල උද්ගමන ආභාසය</u>

යම් නිගමනයක් සනාථ කරනු වස් ඉදිරිපත් කර ඇති සාක්ෂි කාරණයට අදාල වුවත් දුබල නම් ඒවා මෙම ආභාස බාණ්ඩය යටතට ගැනේ. මේ යටතේ පහත ආභාස වර්ගඇත.

**1. ආප්ත ප්‍රමාණ තර්කාභාසය**

පූර්ව දැනුම තර්ක නොකිරීම නිසා මෙම ආභාසය සිදුවේ.

උදා : හොඳ නරක වැනි ඇගයුම්ශීලී කරුණු නිරපේක්ෂ හෙවත් ස්වායත්ත පැවැත්මකින් යුක්ත යැයි ආචාර ධර්ම විද්‍යාඥයින් පවසති. එහෙත් ලෝකයේ සියලු දේ සාපේක්ෂ බව මහා විද්‍යාඥ ඇල්බට් අයින්ස්ටයින් ප්‍රකාශ කරයි. එහෙයින් හොඳ නරක වැනි ඒවාද සාපේක්ෂකයි.

උදා :ලොව දුටු මහා බොක්සිං ශූරයා මොහොමඩ් අලිය. ලොව පෝෂ ජනකම පානය කොත්තමල්ලි බව ඔහු කියයි. ඊටත් වඩා මොන සාක්ෂිද වුවමනා.

**2. අඥාන මූලික අභාසය**

යම් කරුණකට පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වනු වෙනුවට සාක්ෂි පිළිබඳව නොදැනීම හෝ මෙතෙක් සාක්ෂි නොමැතිකම මත පිහිටා යම් මතයක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට යාම අඥාන මූලික ආභාසයයි.

උදා : සර්ව බලධාරී දෙවියන් වහන්සේ කෙනෙක් නැතැයි ඔප්පු කිරීමට මෙතෙක් කිසිවෙක් සමත් වී නැත. එහෙයින් සර්ව බලධාරී දෙවි කෙනෙක් ඇත.

උදා : අප ශරීරයේ ඕනෑම කොටසක් පරීක්ෂා කළ විට ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය කියා දෙයක් සොයාගත නොහැකි වනු ඇත. එහෙයින් ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය මිත්‍යාවකි.

**3. කාකතාලීය න්‍යය ආභාසය**

එකට වෙනස්වන එහෙත් හේතුඵල සම්බන්ධයක් නැති සිද්ධි දෙකක් අතර හේතුඵල සම්බන්ධයක් ඇතැයි වරදවා වටහා ගැනීමෙන් මෙම ආභාසය සිදුවේ.

උදා : ආයුර්වේද වෛද්‍යවරයා කැඳවූ පසු රෝගියා මිය ගියේය. ආයුර්වේද වෛද්‍යවරයා කැඳවූයේ නැත්නම් රෝගියා තවමත් ජීවතුන් අතර සිටිනු ඇත.

උදා: දහවල් 12 ට $x$ නැමති පාසලේ සිනුව නාදවන අතර අසළ වූ $y$ යන ස්ථානයෙක් බස් රියක් පිටව යයි. බස්රිය පිටත් වූයේ පාසලේ සීනුව නාදවීම නිසාය.

**4 න- ගම්‍යතා ආභාසය**

ඉදිරිපත් කරන සාක්ෂි නිගමනයට අදාල වුවද නිගමනය තහවුරු කිරීමට තරම් තාර්කික සබඳතාවයක් නොමැති වූ විට මෙම ආභාසය සිදුවේ.

උදා : මේ දන්තාලේපය ඉතා මිහිර රසකින් යුක්තය. මා දන්නා ලෙස දත්වල නීරෝගී බව අති කිරීම ඊට පුලුවන.

උදා : මානසික හැකියාව අතින් ස්ත්‍රිය හෝ පුරුෂයා අතර කිසිදු වෙනසක් නැත. එහෙයින් මිශ්‍ර අධ්‍යාපනයට විරුද්ධව ගෙනෙන සියලු තර්ක නිෂ්ප්‍රභා වෙයි.

**5. විලෝම යදෘච්ඡා ආභාසය**

යදෘච්ඡා ආභාසයේ විලෝමයයි. එනම් විශේෂ තත්ත්වයකට පමණක් අදාල වන්නා වූ දෙයක් සාමාන්‍යකරණයක් ලෙස ගැනීමෙන් මෙම ආභාසය සිදුවේ.

උදා : උණ සන්නිපාත රෝගීන්ට ගවමස් අගුණදායී ආහාරයකි. එහෙයින් ගවමස් අගුණදායී ආහාරයකි.

උදා : අධිකව මත්පැන් පානය කිරීමෙන් හිරෝෂිස් සෑදේ. එහෙයින් මත්පැන් පානය කරන ඕනෑම අයෙකුට හිරෝෂිස් සෑදේ.

### 6. දුබල සාදෘශ්‍යමය ආභාසය

ප්‍රමාණවත් නොවන හෝ අසම්පූර්ණ වූ හෝ සාවද්‍ය හෝ සමානතා සළකා කරුණු සැසඳීමෙන් නිගමනයක් තහවුරු කිරීමට උත්සාහ කිරීම දුබල සාදෘශ්‍යමය ආභාසයයි.

උදා : පෘථිවිය සහ අඟහරු යන දෙකම ග්‍රහලෝක වේ. පෘථිවියට චන්ද්‍රයෙක් ඇත. එහෙයින් අඟහරු ට චන්ද්‍රයෙක් ඇත.

උදා : නිමල් සහ ගයාන් පන්තියේ පළමු පේළියේ වාඩි වී ඇත. නිමල් උසස් පෙළට $A$ සාමාර්ථ තුනක් ලබා ඇත. එහෙයින් ගයාන් ද උසස් පෙළට $A$ සාමාර්ථ තුනක් ලබා ඇත.

- <u>**සාවද්‍ය පූර්ව විනිශ්චයන් හා සම්බන්ධ ආභාස**</u>

සාවද්‍ය වූ ආකාරයෙන් පූර්ව විනිශ්චය මත පිහිටා එය සනාථ කරන ආකාරයට තර්කය ගොඩනැගීම ආභාසිතයි. මේ යටතේ ඇති ආභාස වර්ග තුනකි.

### 1. සාධ්‍යසම ආභාසය

නිගමනය සහ අවයවය සමාන වීම නිසා මෙම ආභාසය ඇති වේ.

උදා : අබිං නිද්‍රාජනකශීලී ගුණයෙන් යුක්ත නිසා එය නිදිමත ඇති කරවයි.

උදා : මේ බස්රිය සීඝ්‍රගාමී බස්රියකි. මන්ද මෙම බස්රිය අතරමග නොනවත්වා වේගයෙන් තම ගමනාන්තය දක්වා ගමන් කරන නිසා ය.

### 2. බහු ප්‍රශ්න ආභාසය

බොහෝ විට ප්‍රශ්නෝත්තර ක්‍රමයේදී සාධනය කිරීමට අපේක්ෂා කරන පිළිතුර ප්‍රශ්නය තුල කල් තබාම ප්‍රනිශ්චය කිරීම නිසා සිදුවන ආභාසයයි. එක ප්‍රශ්නයකට පිළිතුරු දීමට යාමෙන් අතුරු ප්‍රශ්න ගණනාවක් ඇතිවීම මෙහිදී සිදුවේ.

උදා : කෙදිනක දුම් පානය නොකළ අයෙකුගෙන් ඔබ දුම් පානය කිරීම නවතා ඇත්දැයි ඇසීම

උදා : අවිවාහක කාන්තාවකගෙන් ඔබට දරුවන් කී දෙනෙක් සිටින්නේදැයි ඇසීම

### 3. සාවද්‍ය ද්විධාකරණ ආභාසය

එළඹ ඇති කරුණු සම්බන්ධයෙන් තෙවන විකල්පයකට ඉඩ නොතබා විකල්ප දෙකක් අතරින් එක් විකල්පයක් සාධනය කිරීමට උත්සාහ කිරීම මෙහි දී සිදු වේ.

උදා :මුහුණපා ඇති මේ බැරෑරුම් අවස්ථාවේ එක්කෝ ඔබ මට පිටුපානු ඇත නැත්නම් ඔබ මට උදව්කරනු ඇත. ඔබ මට පිටු පාන්නේ නැතිබව මට විශ්වාසයි. එහෙයින් ඔබ මට උදව්කරනු ඇත.

උදා : උසස් පෙළ සමත් වී ඇති ඔබ එක්කෝ රැකියාවක් කළ යුතුය. නැත්නම් විශ්ව විද්‍යාලයට යා යුතුය. ඔබ විශ්ව විද්‍යාලයට නොයන බැවින් ඔබ රැකියාවකට යා යුතුය.

- <u>**සංදිග්ධතා ආභාස**</u>

වාක්‍යයක් හෝ පදයක් කෙරෙන් ඇඟවෙන ඒවායේ ව්‍යාකූලතාව හේතුකොටගෙන ඔප්පු නොවූ කරුණක් ඔප්පු වූවා සේ සැළකීම සංදිග්ධතා ආභාසයයි. මේවා  දෙවැදෑරුම් වේ.

### 1. වාක්‍යඡල ආභාසය

එළඹ ඇති කරුණු සම්බන්ධව ඉදිරිපත් වී ඇති වැකියෙහි සංදිග්ධතාව හේතුකොට ගෙන ඒ මඟින් අනපේක්ෂිත කරුණු නිගමනය මෙහි ලක්ෂණයයි. ඡල යනු අස්ථාවර හෙවත් අපැහැදිලි බවයි.

උදා : පොලිස් භටයන් සැරපරුෂ වූ නමුත් හැම අයෙක්ම තෘප්තිමත් වූ බව පුවත්පත් වාර්තාවන්හි සඳහන් වේ. එහෙයින් පොලිස් භටයින් වැඩ වර්ජනයට සහභාගි වූ බව ඉන් ගම්‍ය වේ.

උදා : තෝ අසල්වැසියාට විරුද්ධව බොරු සාක්ෂි නොකියවැයි බයිබලයේ සඳහන් වේ. එහෙයින් තෝ අසල්වැසියාට පක්ෂව නම් බොරු සාක්ෂි කීවාට වරදක් නැති බව ඉන් ගම්‍ය වෙයි.

### 2. ශබ්දඡල ආභාසය

පදයන්ගේ අර්ථය ව්‍යාකූල වීමේ හේතුවෙන් සාවද්‍ය නිගමන කරා එළඹීම මෙහිදී සිදුවේ. එකම පදය තැන් දෙකක ද්විත්ව අර්ථ ගැනීමෙන් මෙම ආභාසය සිදු වේ.

උදා : අර ස්ත්‍රිය විවාහ කර ගැනීමෙන් මේ මිනිසා පිස්සු වැඩක් කර ඇත. සියලු පිස්සු වැඩ කරන්නන් අංගොඩ යැවිය යුතුය. ඒ නිසා මේ මිනිසා අංගොඩ යැවිය යුතුය.

උදා : යමක පරිසමාප්තිය එය අංග සම්පූර්ණ බවට පත් වීමයි. මරණය යනු ජීවිතයේ පරිසමාප්තියයි. එහෙයින් මරණය යනු අංග සම්පූර්ණ බවට පත් වීමයි.

- <u>භාෂා සාදෘශ්‍යමය ආභාස</u>

මෙම ආභාස වර්ගයට අයත් වූ තර්කයන්හි භාෂා ස්වරූපය හෝ සංවිධානය අතින් ඕනෑම සප්‍රමාණ තර්කයකට සමානයි. එහෙත් කරුණු අතර සංගතතාව හෙවත් සංවිධාන බව නිගමනයට නොසෑහේ. මේ යටතේ ආභාස දෙකක් දැකිය හැකිය.

**1. වීකෙක ආභාසය**

සමූහයක් පොදුවේ ගත්විට පවතින ලක්ෂණයක් එහි එක් එක් සාමාජිකයෙක් වෙන් වෙන්ව ගත් විටද පවතින්නේ යැයි ගැනීමෙන් සිදුවන ආභාසයයි.

උදා : මේ ගොඩනැගිල්ල ඉතාමත් ශක්තිමත් වූවකි. එහෙයින් මේ ගොඩනැගිල්ලෙහි එක් එක් ගඩොල් කැටයක් ද එක් එක් වැලි කැටයක් ද ඉතාමත් ශක්තිමත් වූවකි.

උදා: මේ ගීතය ඉතාමත් මිහිරිය. එහෙයින් මේ ගීතයේ එක් එක් ස්වරක්ද මිහිරිය.

**2. සාමූහික ආභාසය**

සමූහයක එක් එක් සාමාජිකයකුට වෙන් වෙන්ව පවතින ලක්ෂණයක් එම සමූහය සමස්ථයක් ලෙස ගත්විට ද ඇතැයි ගැනීමෙන් මෙම ආභාසය සිදු වේ.

උදා : ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම අති දක්ෂ ක්‍රිකට් කණ්ඩායමකි. එහෙයින් එහි එක් සාමාජිකයකු වන චරිත් අති දක්ෂ ක්‍රීඩකයෙකි.

උදා : එළවලු ව්‍යාංජනය රසවත් නොවනු ඇත. මක්නිසාද යත් එහි එක් සංඝටකයක්වත් රසවත් නොවන නිසා ය.